00698

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023/2024
**EPU6230 - ප්‍රාථමික පාසල් සැකසුම් තුළ අන්තර්කරණ අධ්‍යාපනය**
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2025.06.22 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ සංකල්පය නිර්වචනය කර එය ක්‍රියාත්මක කිරීමට සහය වන ජාත්‍යන්තර ප්‍රතිපත්ති දෙකක් (02) සඳහන් කරන්න.

02. විෂයමාලා ඉඩ සැලසීම සහ සංශෝධනය යන පද උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

03. ආබාධ සහිත දරුවන් අන්තර්කරණය සඳහා බහුලව භාවිත වන සහායක තාක්ෂණ වර්ග තුනක් (03) ලැයිස්තුගත කර විස්තර කරන්න.

04. ඔටිසම් පරාසයික අක්‍රමතා තත්ත්වය සහිත සිසුවෙකුට සහාය වීම සඳහා ගුරුවරයෙකුට පන්ති කාමර පරිසරය ඵලදායී ලෙස අනුවර්තනය කළ හැකි ක්‍රම දෙකක් (02) සඳහන් කරන්න.

05. කරුණු පහක් (05) ඉස්මතු කරමින් සාම්ප්‍රදායික ගුරුවරයාගේ භූමිකාව සහ අන්තර්කරණ ගුරුවරයාගේ භූමිකාව සංසන්දනය කරන්න.

06. පන්ති කාමර ක්‍රියාකාරකම් වලදී අවධාන ඌනතා සහිත අධි ක්‍රියාකාරී තත්ත්වය (ADHD) සහිත සිසුවෙකුට සහය වීම සඳහා අන්තර්කරණ උපාය මාර්ග දෙකක් (02) යෝජනා කරන්න.

07. ඉගෙනීම සඳහා විශ්වීය ආකෘති (UDL) සංකල්පය සහ අන්තර්කරණ පරිසරයේදී එහි වැදගත්කම පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ අන්තර්කරණ පන්ති කාමරවල ගුරුවරුන් මුහුණ දෙන අභියෝග දෙකක් (02) කෙටියෙන් සාකච්ඡා කරන්න.

ලකුණු 05 X 08 =40

## II කොටස

09. (අ) අන්තර්කරණ අධ්‍යාපන ප්‍රතිපත්තිවල ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 05 )

(ආ) යුනෙස්කෝ සංවිධානයට අනුව අන්තර්කරණ අධ්‍යාපනයේ මූලධර්ම හතරක් (04) ගෙනහැර දක්වන්න. (ලකුණු 08 )

(ඇ) මෙම මූලධර්ම ප්‍රාථමික පන්ති කාමරයක භාවිතයන් කෙරෙහි බලපාන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 07 )

10. (අ) සංවේදක ඉන්ද්‍රීය දුර්වලතා ඇති දරුවන්ව ගුරුවරුන්ට හඳුනා ගත හැකි ආකාරය උදාහරණ ඉදිරිපත් කරමින් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 )

(ආ) ඔටිසම් පරාසයික ආබාධ තත්ත්වය සහ අවධාන ඌනතා සහිත අධි ක්‍රියාකාරී තත්ත්වය (ADHD) සහිත දරුවන්ගේ ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 08 )

(ඇ) ප්‍රාථමික ගුරුවරයෙකුට ADHD තත්ත්වය ඇති සිසුන්ට සහාය විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 07 )

11. (අ) විෂයමාලා අනුවර්තනය යන පදය නිර්වචනය කර එය ක්‍රියාත්මක කල හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05 )

(ආ) අන්තර්කරණ පන්ති කාමරයක භාවිත කළ හැකි විෂයමාලා අනුවර්තන වර්ග නවයක් (09) සඳහන් කරන්න. (ලකුණු 07)

(ඇ) ඉහත වර්ග වලින් ඕනෑම දෙකක් තෝරාගෙන කියවීමේ දුබලතාවක් ඇති සිසුවෙකුට සහාය වීමට ගුරුවරයෙකු අනුවර්තනය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 )

12. (අ) ඉගෙනුම් විවිධාංගීකරණය යන යෙදුම නිර්වචනය කර, එය කල හැකි ආකාර තුනක් (03) හඳුනා ගන්න.

(ලකුණු 05 )

(ආ) අන්තර්කරණ පන්ති කාමරයක පාඩම් සැලසුම් කිරිමට ඉගෙනුම් විලාසයන් (දෘශ්‍ය, ශ්‍රවණ, චාලක) බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 )

(ඇ) භාෂාව හෝ ගණිතය පාඩමකට අදාලව විවිධාංගීකරණය කරන ලද ක්‍රියාකාරකමකට උදාහරණයක් සපයන්න. (ලකුණු 07 )

13. පහත කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු ලබා දෙන්න. A කොටස හෝ B කොටස

A කොටස

(අ) සහයෝගී ඉගැන්වීම යනු කුමක්ද? අන්තර්කරණ පන්ති කාමරවල භාවිතා කරන සහයෝගී ඉගැන්වීම් ආකෘති තුනක් (03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05 )

(ආ) සම-ඉගැන්වීමේ ආකෘතියක ගුරුවරුන්ගේ භූමිකාවන් පැහැදිලි කරන්න. (ලකුණු 08 )

(ඇ) සමවයස් මිතුරන්ගේ මැදිහත්වීමෙන් ලබාදෙන උපදෙස්වල (සම- වයස් මිතුරන් හරහා ලැබෙන ඉගෙනුම් සහ සහයෝගී ඉගෙනීම ) ඇති ප්‍රතිලාභ අගයන්න. (ලකුණු 07 )

B කොටස

(අ) අන්තර්කරණ අධ්‍යාපනය සඳහා ගුරුවරුන්ට අවශ්‍ය වෘත්තීය නිපුණතා තුනක් (03) හඳුනා ගන්න.

(ලකුණු 05 )

(ආ) ශ්‍රී ලංකාවේ අන්තර්කරණ පන්ති කාමරවල ගුරුවරුන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 08 )

(ඇ) ඉහත සඳහන් කළ අභියෝග ජය ගැනීම සඳහා විසඳුම් හෝ උපාය මාර්ග යෝජනා කරන්න.

(ලකුණු 07 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*